## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - 2017

---

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනතේ 10(අ)(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSA1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පොල් පෙරසැරි ව්‍යාපෘතියට අයත් ගොඩනැගිල්ලේ රු. 10,948,998 ක් වූ ඉදිකිරීම් පිරිවැය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මූල්‍ය ප්‍රකාශනවල කෙරී ගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. තවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 07 හි 69 ඡේදය ප්‍රකාරව, වත්කමක් ක්ෂය කිරීම, එය භාවිතා කිරීමට සුදුසු තත්ත්වයට පත්වූ පසු ආරම්භ කල යුතු වුවත් මෙම ගොඩනැගිල්ල 2016 වර්ෂයේ සිට ආරක්ෂක විශ්වවිද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපය විසින් ශරීර යෝග්‍යතා අභ්‍යාස මධ්‍යස්ථානයක් වශයෙන් භාවිතා කර තිබුණ අතර, ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් 2013 වර්ෂයේදී විදේශීය මුදලින් එ.ජ.ඩො මිලියන 177.33 ක් හා දේශීය මුදලින් රු.මිලියන 3,165.82 ක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ණය වශයෙන් ලබා ගෙන තිබුණි. බැංකුව විසින් ඉදිරිපත් කර තිබුණු තොරතුරු වලට අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට විදේශීය මුදල් ණය පොලිය ලෙස එ.ජ.ඩො මිලියන 17.63 ට සමාන රු.මිලියන 2,735.29 ක් හා දේශීය ණය පොලිය ලෙස රු.මිලියන 433.55ක් ගෙවිය යුතුව තිබුණි. කෙසේවෙතත්, දේශීය මුදලින් ලබා ගත් ණය, විදේශීය මුදලින් ගත් ණය ලෙස සලකා එ.ජ.ඩො. 1 ක් රු. 155.15 ක් වූ විනිමය අනුපාතිකය මත පරිවර්තනය කර ගිණුම්වල දැක්වීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දේශීය ණය මුදල රු. 604,324,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද, ණය වාරික ගෙවීම 2022 වර්ෂයේ සිට ආරම්භ කල යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන වල එම ණය මුදල ජංගම වගකීම් යටතේ පෙන්වා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය විසින් විදේශීය ශිෂ්‍යයින් සඳහා සපයනු ලබන ආහාර හා නවාතැන් පහසුකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු එකතුව එ.ජ.ඩොලර් 43, 552 කට සමාන රු. 6,757,093 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත උපකරණ යටතේ ඉඩම් සංවර්ධනය කිරීම් යටතේ දක්වා තිබුණු රු. 1,873,445,037 ක වත්කම් වටිනාකම තුල, වටිනාකම රු. 29,891,597 ක් වූ වායු සමීකරණ හා ගිණි නිවීමේ උපකරණ සහ වටිනාකම රු. 136,586,867 ක් වූ විදුලිය ස්ථාපනය කිරීමේ වියදම ඇතුලත් කර තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්

2011 වර්ෂයේ සිට කෙරී ගෙන යන වැඩ යටතේ අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශය තුළ ඉදිරියට ගෙන එමින් පැවති වටිනාකම රු. 13,874,542 ක් වූ ගොඩනැගිලි හා වෙනත් වත්කම් විගණනයේදී භෞතිකව සත්‍යාපනය කල නොහැකි විය. තවද, වටිනාකම රු.43,803,874 ක් වූ ඉඩම් සංවර්ධන පිරිවැය නොනිමි වැඩ යටතේ 2008 වර්ෂයේ සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරියට ගෙන එමින් පැවතියද එම අගයෙන් නියෝජනය වූ වත්කම් පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

### 2.3 ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ණය හිමියන්, උපචිත වියදම්, සහ අනෙකුත් ණය හිමියන් යටතේ පිළිවෙලින් රු.19,720,235 ක් රු.1,196,249,776 ක් සහ රු.2,186,922,093 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, ඉන් වර්ෂ 02 කට අධික කාලයක සිට නිරවුල් නොකර පැවති ශේෂ එකතුව රු. 85,014,562 ක් විය.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත | පනතට අනුකූල නොවන ලෙස විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ කළමනාකරණ මණ්ඩලයේ ලේකම්වරයා යන නිලධාරීන් කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් ලෙස සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර තිබුණි |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 237(ආ) | මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට පෙර අදාළ භාණ්ඩ සියල්ල ලැබී ඇති බවට ද, අදාළ තොග ලේඛනයන්හි එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවටද සහතික කළ යුතු වුවද, ඊට අනුකූල නොවන ලෙස 2017 වර්ෂය තුළදී අවස්ථා 619 කදී භාණ්ඩ මිලදී ගැනීමට පෙර රු.83,283,251 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. ඉහත පරිදි ඉකුත් වර්ෂ 05 ක කාලය තුලදී අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණු රු.19,175,853ක් වූ ශේෂය 2017 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) වගන්තිය | වටිනාකම රු. 500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා සඳහා විධිමත් ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී එළඹ තිබුණු වටිනාකම රු.8,632,941 ක් වූ භාණ්ඩ මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තු 03 ක් සම්බන්ධයෙන් විධිමත් පරිදි ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි. |
| (ඈ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | (i) කිසියම් විශේෂිත කාර්යයන් සඳහා ලබාදෙන අතුරු අග්‍රිමයන් අදාල කාර්ය නිමකල විගසම පියවිය යුතු වුවත්, නිලධාරීන් 16 දෙනෙකු සඳහා ලබාදී තිබූ රු. 2,316,213 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් පියවා නොතිබුණි. |

(ii) කිසියම් විශේෂිත කාර්යයක් සඳහා තත්කාර්යය අතුරු අග්‍රිම ලබාදීමේදී මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු. 100,000 ක උපරිමයක් දක්වා අග්‍රිමය ලබාදිය හැකි අතර එම මූල්‍ය සීමාව ඉක්මවන අවස්ථාවලදී මහා භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබාගත යුතුය එහෙත් ඊට අනුකූල නොවන ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 19 දෙනෙකු සඳහා රු. 1,883,685 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 48,769,301 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 23,216,355 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 25,552,946 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මුළු ආදායම රු.393,632,900 කින් වැඩි වී තිබුණද විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහල ඉදිකිරීම සම්බන්ධයෙන් විදේශ මුදලින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමේදී සිදු වූ විනිමය අවාසිය රු.199,755,658 කින් හා අනෙකුත් වියදම් රු.219,430,188 කින් වැඩි වී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 සිට 2017 වර්ෂය දක්වාම මූල්‍ය ප්‍රතිඵලයේ අඛණ්ඩ ඌනතාවයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීම් කිරීමෙන් පසු 2013 වර්ෂයේදී රු.359,865,269 ක් වූ විශ්වවිද්‍යාලයේ දායකත්වය 2014 වර්ෂයේදී රු.446,202,208 ක් දක්වා වර්ධනය වී තිබුණු නමුත් 2015 හා 2016 වර්ෂවලදී ක්‍රමයෙන් පහල ගොස් තිබුණි. කෙසේ වෙතත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එය රු. 41,704,976 කින් වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයේදී ස්කන්ධ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය සියයට 0. 316 ක සෘණ අගයක් ඇතිවී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එය සියයට 0.47 ක සෘණ අගයක් දක්වා පහල ගොස් තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල ජංගම අනුපාතය පිළිවෙලින් 0.3 සහ 2.5 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතයේ පිරිහීමක් නිරීක්ෂණය විය. ශික්ෂණ රෝහල ඉදිකිරීම සඳහා ලබා ගෙන තිබූ ණය මුදල් සමාලෝචිත වර්ෂයේදී ජංගම වත්කම් යටතේ දක්වා තිබීම මෙම අනුපාතය පිරිහීම සඳහා හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආරක්ෂක සේවාවන්හි සේවා නියුක්ත නිලධාරීන් සඳහා ආරක්ෂක කටයුතු සම්බන්ධ උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා 1981 අංක 68 දරන ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ පිහිටුවා තිබුණු මෙම ආයතනය 1988 අංක 27 දරන සහ 2007 අංක 50 දරන සංශෝධිත පනත් මගින් විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කර තිබුණු නමුත් ආරක්ෂක සේවාවන්හි සේවා නියුක්ත නොවන විද්‍යාර්ථයින්ටද උපාධි පිරිනැමීමට බලය පැවරීම සඳහා වූ වගන්ති උක්ත පනත් තුල ඇතුළත් කර නොතිබුණි. කෙසේ වෙතත් ආරම්භයේ සිට 2017 දෙසැම්බර් 31 දින වන විට මුදල් ගෙවීමේ පදනම මත විදේශීය ශිෂ්‍යයන් 177 ක්ද ඇතුළත්ව බාහිර සිසුන් 3,329 ක්ද බඳවා ගෙන උපාධි පිරිනමා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය උපාධිය සඳහා හැර අනෙකුත් උපාධි පාඨමාලාවන් සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේදී රණවිරු පවුල් වෙනුවෙන් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 20 ක ශිෂ්‍ය ප්‍රමාණයක් වෙන් කිරීමට 2011 පෙබරවාරි 18 දින පැවති ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. එහෙත් එම ශිෂ්‍ය ප්‍රමාණය තෝරා ගැනීමේ පදනම පිළිබඳව නිශ්චිතව දක්වා නොතිබුණි. මේ හේතුවෙන් උපාධි පාඨමාලාවන් සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීමේදී රණවිරු පවුල් වල සිසුන් සඳහා පහල ඉසෙඩ් ලකුණු අගයන් හා අනෙකුත් සිසුන් සඳහා ඉහල ඉසෙඩ් ලකුණු අගයන් වශයෙන් සලකා විද්‍යාර්ථයින් ඇතුලත් කර ගැනීමට කටයුතු කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 01 වන දා සිට 2011 මැයි 11 දින දක්වා වූ කාලය තුළ ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු එකතුව රු.8,210,785 ක් වූ දායක මුදල් අදාල කාලය තුළ ප්‍රේෂණය කර නොතිබූ අතර ඒඅනුව අධිභාර වලට යටත් විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, සේවක පඩිනඩි සම්බන්ධ ගෙවීම් ආරක්ෂක විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවිය යුතු වුවත් උක්ත දායක මුදල 2017 ජූනි 14 දින විශ්වවිද්‍යාලයේ ස්වයං මූල්‍ය අරමුදලෙන් ගෙවා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දින වන විට සිසුන් 346 ක් දක්ෂිණ මණ්ඩපය තුළ අධ්‍යයන කටයුතු සිදුකරනු ලබන නමුත් දේශනශාලා 08 කින් සමන්විත වූ මෙම මණ්ඩපයේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් පවතින දේශනශාලා ධාරිතාවය ප්‍රමාණවත් මට්ටමක නොතිබුණු බව නිරීක්ෂණය විය. දක්ෂිණ මණ්ඩපය යටතේ ඇති පරිගණක පීඨයේ පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට සිසුන් 166 දෙනෙක් ඇතුළත් කරගෙන තිබුණු නමුත් ඔවුන්ට ප්‍රමාණවත් පරිගණක අධ්‍යයන පහසුකම් නොතිබීම හේතුවෙන් නිර්මිත පරිසර හා අවකාශීය විද්‍යා පීඨයට අයත් පරිගණක විද්‍යාගාරයක අධ්‍යන කටයුතු සිදු කර තිබුණි. එමෙන්ම දක්ෂිණ මණ්ඩපය සඳහා ස්ථිර පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකර නොතිබීම හේතුවෙන් උපාධි අපේක්ෂකයින් සඳහා වූ පුස්තකාලය වර්ග අඩි 1152 ක් වූ සෙවිලි තහඩු වලින් නිම කර තිබුණු පෙර නිමි ගොඩනැගිල්ලක පවත්වා ගෙන යන බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) 2017 ජනවාරි 10 වන දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයන්ට අනුව යෝජිත ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන තෙක් ආරක්ෂක විශ්වවිද්‍යාලීය ශික්ෂණ රෝහල වෙතට අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පරිපාලනය කිරීම පිණිස වන අන්තර් කාලීන වැඩ පිළිවෙලකට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව, රෝහල් කටයුතු පවත්වා ගෙන යාම සඳහා නිල බලයෙන් පත්කල සාමාජිකයන් 13 දෙනෙකු සහ අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලැබූ සාමාජිකයන් 6 දෙනෙකු ඇතුලත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර තිබුණි.කෙසේ වෙතත් 2017 දෙසැම්බර් 31 දින වන තෙක් ශික්ෂණ රෝහලේ පරිපාලන ව්‍යුහය තීරණය කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දක්ෂිණ මණ්ඩපය, මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හෙක්ටයාර් 161.7363 ක භූමියක සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරිය වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් හෙක්ටයාර් 7.6838 ක භූමියක ස්ථාපිත කර තිබූ නමුත් එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව විශ්ව විද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් අදියර 4 ක් යටතේ වේරහැර ප්‍රදේශයේ ශික්ෂණ රෝහලක් ඉදිකිරීමේ කටයුතු 2013 අප්‍රේල් 04 දින ආරම්භ කර තිබුණු අතර, 2017 මැයි 20 වන විට ඉදිකිරීම් නිමකර තිබුණි. එහෙත් එක් එක් අදියර සඳහා අවශ්‍ය කරන වෛද්‍ය උපකරණ සවිකිරීම සඳහා ඇ.එ.ජ.ඩොලර් 39,629,000 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත් එම උපකරණ මිලදී ගැනීම සැලසුම් කල පරිදි සිදුකර නොතිබුණි. තවද රෝහල තුල ක්‍රියාත්මක කළ යුතු සේවාවන් ඉටු කිරීම සඳහා ඒකක 13 ක් හඳුනාගෙන තිබුණු අතර, නියමිත කාර්යමණ්ඩලය නොමැතිකම, අවශ්‍ය වෛද්‍ය උපකරණ ස්ථාපනය කර නොතිබීම, යනාදී හේතූන් මත එම අංශයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) දක්ෂිණ මණ්ඩපයට අදාල ගොඩනැගිලි ඉදිකිරීම් 2011 වර්ෂයේදී ආරම්භ කර අදියර 03 ක් යටතේ නිම කිරීමට සැලසුම් කර තිබුණු අතර, 2015 වර්ෂයේදී පලමු අදියර නිම කිරීමටත් 2019 වර්ෂය අවසාන වන විට අනෙක් අදියරයන්ගේ ඉදිකිරීම් නිම කිරීමටත් යෝජිතව පැවතුණි. එහෙත් දෙවන අදියර හා තෙවන අදියරවල කටයුතු සඳහා ප්‍රමාණවත් අරමුදල් නොමැති වීමෙන් මන්දගාමීව සිදුවන බව නිරීක්ෂණය විය.

(ඇ) ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහල ඉදිකිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ ඇපකරයක් මත 2013 අප්‍රේල් 29 දින එ.ජඩො මිලියන 177.33 කට සමාන රු.23,102,546,177 ක විදේශ මුදලින් ණයක් සහ රු.3,165,821,000 ක් වූ දේශීය මුදලින් ණයක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගෙන තිබුණි. එම ණය මුදල 2033 වර්ෂය අවසාන වන විට විශ්වවිද්‍යාලය විසින් ගෙවා නිමකළ යුතුව පැවති අතර ඒ සඳහා 2018 වර්ෂයෙන් පසුව ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් උපයනු ලබන ආදායම් මගින් ණය වාරික ගෙවීමට කටයුතු කල යුතු විය. එහෙත් 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ ඌනතාවයක් වූයෙන් උක්ත ණය මුදල පියවීම ගැටළු සහගත බව නිරීක්ෂණය විය.

**4.4** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2015 අප්‍රේල් 30 වන දින ශික්ෂණ රෝහල ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2017 මැයි 20 වන දින වන විට ඉදිකිරීම් කටයුතු වර්ෂ 02 ක් ප්‍රමාද වී තිබීම හේතුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගැනීමට නියමිතව තිබුණු එ.ජ.ඩො මිලියන 177.33 ක් වූ ණය මුදල ලබා ගැනීම ප්‍රමාද වී තිබුණි. උක්ත ණය මුදල ලබා ගැනීමේ ප්‍රමාදය නිසා විදේශ විනිමය හුවමාරු අනුපාතික වෙනස් වීම මත ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් පාඩුව පියවා ගැනීම සඳහා රු.මිලියන 400 ක අතිරේක ණය වටිනාකමක් ණය මුදලට එකතු කරන බව ලිඛිතව දක්වා තිබුණි.

**4.5** **කාර්යමණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** ත්‍රිවිධ හමුදාවෙන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අයත් ඒකකවලට අනුයුක්ත කර සිටි නිලධාරීන් පිළිබඳ විස්තර පහත පහත පරිදි විය.

| ආයතනය | මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාව | මාණ්ඩලික නොවන නිලධාරීන් සංඛ්‍යාව | මුළු ගණන |
|---|---|---|---|
| කො.ආ.වි. රත්මලාන | 106 | 809 | 915 |
| කො.ආ.වි. ශික්ෂණ රෝහල | 49 | 313 | 362 |
| දක්ෂිණ මණ්ඩපය සූරියවැව | 11 | 85 | 96 |
| එකතුව | 166 | 1,207 | 1,373 |

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා ඉහත සඳහන් පරිදි ත්‍රිවිධ හමුදා සාමාජිකයින් මුදා හැර තිබුණු අතර එම නිලධාරින්ගේ පාරිශ්‍රමිකයන් හා දීමනා අදාල ආරක්ෂක හමුදාවන් මගින් ගෙවා තිබුණි. විශ්වවිද්‍යාලය සඳහා අනුමත කාර්යමණ්ඩලයට අමතරව අනුයුක්ත කර තිබූ ත්‍රිවිධ හමුදා නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබා ගන්නා ලෙස 2017 මාර්තු 23 වන දින පැවති රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව විසින් උපදෙස් ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් එවැනි අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** විශ්වවිද්‍යාලයේ පීඨයන් 08 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 369 දෙනෙකු වුවද 2017 දෙසැම්බර් 31 දින වන විට සේවා නියුක්ත කාර්ය මණ්ඩලය නිලධාරීන් 284 දෙනෙකුගෙන් සමන්විත විය. තවද, මෙම පීඨ සඳහා අනුමත මහාචාර්යවරු සහ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරුන් පිළිවෙලින් 47 ක් හා 161 දෙනෙකු වුවද 2017 දෙසැම්බර් 31 දින වන විට අනුයුක්තව සිටි සංඛ්‍යාව පිළිවෙලින් 19 ක් හා 99 ක් පමණක් වූ බව නිරීක්ෂණ විය.

**(ඇ)** විශ්වවිද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපයේ ක්‍රියාත්මකව පැවති අධ්‍යයන පීඨ දෙකෙහි අනුමත අචාර්ය මණ්ඩලය 75 දෙනෙක් වුවද 2017 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්ත ආචාර්ය මණ්ඩලයක් 29 දෙනෙක් පමණක් විය. තවද , මෙම මණ්ඩපය සඳහා මහාචාර්ය තනතුරු 12 ක් අනුමත වී තිබුණු නමුත් 2017 දෙසැම්බර් 31 දිනට කිසිදු මහාචාර්යවරයෙකු බඳවා ගෙන නොතිබුණි. දක්ෂිණ මණ්ඩපය සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 40 ක් අනුමත වී තිබුණු නමුත් 2017 දෙසැම්බර් 31 දිනට කථිකාචාර්යවරුන් 13 දෙනෙක් පමණක් සේවා නියුක්ත කර තිබුණි. ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සේවා නියුක්ත කිරීම සඳහා විකල්ප අවස්ථාවන් විශ්වවිද්‍යාලය විසින් සලකා බලා නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

---

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලගාකර ගැනීම

---

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 ලිපිය සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජූලි 31 දැනැති බීඩී/සීබීපී/4/1/2 - 2018 දරන චක්‍රලේඛය පිළිබඳව අවධානය යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් සිය විෂය පථයට අනුව ලගා කරගත යුතු තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ලගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක හඳුනාගෙන නොතිබීම හේතුවෙන් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනයන්, මානව සම්පත් සහ භෞතික සම්පත් පිළිබඳ අවධානය යොමු කිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තියට අනුව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි 17 වන දින දීය.

### 6.2 අභ්‍යන්තර විගණනය

---

අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර සිටි විගණන කාර්යය මණ්ඩලය නිලධාරීන් 04 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ආරක්ෂක විශ්වවිද්‍යාලයට අනුබද්ධ දක්ෂිණ මණ්ඩපය හා ශික්ෂණ රෝහලද ඇතුලත්ව පුළුල් කාර්යභාරයක් ඉටුකරන ආයතනයක් බවට පරිවර්තනය වී තිබෙන නමුත් ඊට සරිලන ලෙස අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය වැඩි කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු වී නොතිබුණු බව නිරීන්ෂණය විය.

### 6.3 ප්‍රසම්පාදනයන්

---

විශ්වවිද්‍යාලය විසින් එක් එක් මුදල් වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙල කරන නමුත් ඊට ඇතුලත් වී තිබුණේ භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වූ ප්‍රාග්ධන වියදම් පමණි. මෙම ප්‍රසම්පාදන සැලස්ම ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් ස්වයං මූල්‍ය අරමුදල මගින් සිදුකල ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රසම්පාදන සැලස්මක් පිළියෙල කර ඒ සඳහා අදාල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

### 6.4 අයවැය ලේඛනමය පාලනය

---

සමාලෝචිත වර්ෂය තුලදී වියදම් ඒකක 05 ක ඇස්තමේන්තු ගත වියදම සහ සත්‍ය වියදම අතර සියයට 21 සිට සියයට 73 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය විය.

**6.5 නොවිසඳී ඇති විගණන ඡේද**

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් අක්කර 47 රූඩ් 37.9 ක් වූ ඉඩමක විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහල ඉදිකර තිබුණු නමුත් 2017 දෙසැම්බර් 31 දින වනතෙක් එහි අයිතිය පවරා ගෙන නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

| | **පද්ධති පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|---|
| **(අ)** | කොන්ත්‍රාත් පාලනය | ලිඛිත ගිවිසුම් වලට එලඹීමෙන් තොරව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම. |
| **(ආ)** | මිලදී ගැනීම් පාලනය | **(i)** රජයේ මූල්‍ය රෙගුලාසි හා ප්‍රසම්පාදන මඟ පෙන්වීම් වලට පරිබාහිරව භාණ්ඩ මිලදී ගැනීම.<br>(ii) භාණ්ඩ ලැබීමට පෙර අත්තිකාරම් ගෙවීම. |